TRADE AND SUPPORTING SERVICES

(Part-III)

රක්ෂණ සේවා

අවදානම් ඒකරාශී කර එක් පාර්ශ්වයකට සිදුවන හානිය හෝ පාඩුව සාමුහික ව බෙද ගැනීම රක්ෂණයයි.

රක්ෂණයේ පදනම අවදානම් ඒකරාශී කිරීම යි.

රක්ෂණයෙන් සිදු කරනුයේ විවිධ අවදානම්වලට මුහුණ දීමට සිදු වෙතැයි අපේක්ෂා කරන අය විසින් ගෙවනු ලබන වාරිකවලින් සමන්විත පොදු අරමුදලකින් එම අවදානම්වලට නිශ්චිත වශයෙන් ම මුහුණ දුන් අයට වන්දි ගෙවීමයි.

රක්ෂණයට සම්බන්ධ වන පාර්ශ්ව

1. පළමු පක්ෂය - රක්ෂණ ආවරණය ලබන පාර්ශ්වය හෙවත් රක්ෂිතයා
2. දෙවන පක්ෂය - රක්ෂණ ආවරණය ලබාදෙන පාර්ශ්වය හෙවත් රක්ෂකයා ය. රක්ෂකයා යනු රක්ෂණ ආයතනයයි.
3. තෙවන පක්ෂය - රක්ෂණ ගිවිසුමෙන් බලපෑමක් වන අනෙකුත් සියලුම පාර්ශ්ව හා දේපළ වේ.

ClassWork.LK

රක්ෂණ මූලධර්ම

- රක්ෂ්‍ය හිමිකම
- උපරිම විශ්වාසය
- හානි පූරණය

රක්ෂ්‍ය හිමිකම - ජීවිතයක් හෝ දේපළක් රක්ෂණය කිරීමට යම් පාර්ශ්වයකට ඇති නීත්‍යනුකූල අයිතිය

උදා: ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර එකිනෙකාගේ ජීවිතය පිළිබඳ ව රක්ෂ්‍ය හිමිකමක් පවතී.

උපරිම විශ්වාසය - රක්ෂණ ගිවිසුමට එළඹෙන දෙපාර්ශ්වයම එම ගිවිසුමට අදාළ සියලුම තොරතුරු නිවැරදි ව ඔවුනොවුන්ට හෙළිදරවු කළ යුතු බව

හානි පූරණය - රක්ෂිත දේපළකට යම් හානියක් සිදු වුවහොත් එම හානිය යථා තත්ත්වයට පත් කර ගැනීමට සරිලන වන්දියක් පමණක් ගෙවිය යුතු බව

ClassWork.LK

ජීවිත රක්ෂණය (ජීවිත ආරක්ෂණය)

පුද්ගලයෙකුගේ ජීවිතය හා සම්බන්ධ ව සිදුවිය හැකි හානි වෙනුවෙන් සිදු කරනුයේ ජීවිත රක්ෂණයයි.

ජීවිත රක්ෂණයේ වැදගත්කම

- ඉතිරි කිරීමේ ක්‍රමයක් ලෙස හෝ ආයෝජන මාර්ගයක් ලෙස යොදා ගත හැකි වීම.
- ඔප්පුව කල් පිරෙන තෙක් ජීවත් වුවහොත් රක්ෂිත මුදල හා අනෙකුත් ප්‍රතිලාභ රක්ෂිතයාට ලබාගත හැකි වීම.
- රක්ෂිතයා අකල් මරණයකට පත් වුවහොත් නම් කරන ලද අයට වන්දි ලබා ගැනීමට හැකි වීම.
- දූ දරුවන්ගේ විවාහ, අධ්‍යාපන කටයුතුවලදී මූල්‍ය සහන ලබාගත හැකි වීම.
- මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීමේ දී ඇපයක් ලෙස භාවිත කළ හැකි වීම.

ClassWork.LK

දේපළ රක්ෂණය

ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, රථ වාහන, බඩු තොග වැනි දේපළවලට සිදුවිය හැකි අවදානම් ආවරණය කිරීම වෙනුවෙන් ලබා ගන්නා රක්ෂණයයි.

රක්ෂණ ආයතන මෙවැනි රක්ෂණ සඳහා විවිධ ආකාරයේ රක්ෂණ ඔප්පු නිකුත් කරයි.

උදා : ගිනි රක්ෂණ ඔප්පු, රථවාහන රක්ෂණ ඔප්පු

දේපළ රක්ෂණයේ වැදගත්කම

- ව්‍යාපාර දේපළවලට සිදු විය හැකි විවිධ අවදානම් තුළින් පැන නගින මූල්‍ය අලාභ ආවරණය කරගත හැකි වීම.
- ව්‍යාපාර කටයුතු අඛණ්ඩ ව කරගෙන යාමට උපකාරී වීම.
- දේශීය මෙන් ම විදේශීය වෙළෙඳාම් කටයුතුවල දී උපකාරී වීම.

ClassWork.LK

ජීවිත රක්ෂණය හා දේපළ රක්ෂණය අතර ඇති වෙනස්කම්

ජීවිත රක්ෂණය	දේපළ රක්ෂණය
• රක්ෂණ ඔප්පුවේ වටිනාකම ජීවිත අවදානම හා රක්ෂිතයාගේ ගෙවීමේ හැකියාව මත තීරණය වේ.	• රක්ෂණ ඔප්පුවේ වටිනාකම අදාළ දේපළවල මූල්‍යමය වටිනාකම අනුව තීරණය වේ.
• හානි පූරණ මූලධර්මය බල නොපායි.	• හානි පූරණ මූලධර්මය බලපායි.
• අමතර ප්‍රතිලාභ හිමි වේ.	• අමතර ප්‍රතිලාභ හිමි නොවේ.

Class Work.LK

සන්නිවේදන සේවා

පණිවුඩ, තොරතුරු සහ අදහස් විවිධ පාර්ශ්ව අතර යම් මාධ්‍යයක් මගින් හුවමාරු කර ගැනීම.

ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනයේ ඇති වැදගත්කම

- තරගකාරී වෙළෙඳපළ තුළ ව්‍යාපාරවල සාර්ථකත්වයට හා පැවැත්මට.
- ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට.
- ව්‍යාපාරයට සම්බන්ධිත විවිධ පාර්ශ්ව වෙත තොරතුරු ලබා දීමට.

ව්‍යාපාර ආයතන විසින් සම්බන්ධතා පවත්වන විවිධ පාර්ශ්ව පදනම් කරගෙන සන්නිවේදනය ප්‍රධාන කොටස් 2 කි.

1. අභ්‍යන්තර සන්නිවේදනය
2. බාහිර සන්නිවේදනය

ClassWork.LK

අභ්‍යන්තර සන්නිවේදනය

ආයතනය තුළ විවිධ පාර්ශ්ව අතර විවිධ මාධ්‍ය හරහා පණිවුඩ, තොරතුරු හා අදහස් හුවමාරු කර ගැනීම.

උදා : අයිතිකරුවන්, කළමනාකරුවන් හා සේවකයන්

සන්නිවේදනය සිදු වන වාර ගණන ඉතා වැඩිය.

බොහෝ විට යවන්නා හා ලබන්නා අතර දුර අවම ය.

බාහිර සන්නිවේදනය

ව්‍යාපාර ආයතනයක් බාහිර පුද්ගලයන් හා බාහිර ආයතන සමග සිදු කරනු ලබන සන්නිවේදනය

උදා : ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, සිල්ලර හා තොග වෙළෙඳුන්

අභ්‍යන්තර සන්නිවේදනයට සාපේක්ෂ ව බාහිර සන්නිවේදනය සිදුවන වාර ගණන අඩු ය.

බොහෝ විට මෙහි දී යවන්නා හා ලබන්නා අතර සාපේක්ෂ ව වැඩි දුරක් පවතී.

ClassWork.LK

ව්‍යාපාර විසින් භාවිත කරන විවිධ සන්නිවේදන මාධ්‍ය

1. **වාචික** - රැස්වීම්, සාකච්ඡා, වැඩමුළු, සම්මන්ත්‍රණ, දුරකථන සංවාද

2. **ලිඛිත** - ලිපි, දැන්වීම් පුවරු, වාර්තා, අත් පත්‍රිකා, පුවත්පත්, සඟරා

3. **විද්‍යුත්** - ශබ්දවාහිනී යන්ත්‍ර, ඩිජිටල් පුවරු, විද්‍යුත් තැපෑල (E-mail), ෆැක්ස්, අන්තර්ජාලය, ගුවන්විදුලි මාධ්‍ය, රූපවාහිනී මාධ්‍ය

4. **සංකේත හා සංඥා** - මාර්ග සංඥා, පිළිගත් සංකේත, සීනුව

ClassWork.LK

<u>සන්නිවේදන ක්‍රියාවලිය</u>

සන්නිවේදනය තනි ක්‍රියාවක් නොව පොදු මූලිකාංග කිහිපයක එකතුවකින් සැකසී ඇති ක්‍රියාවලියකි.

එම මූලිකාංග නම්,

- **යවන්නා** - පණිවුඩය ලබා දෙන පුද්ගලයා හෝ ආයතනය
- **පණිවිඩය** - යවන්නා විසින් සපයන තොරතුරු
- **මාධ්‍යය** - පණිවුඩය යැවීම සඳහා යොදා ගන්නා සන්නිවේදන මාධ්‍යය
- **ලබන්නා** - පණිවුඩය ලබන තැනැත්තා
- **ප්‍රතිචාරය** - පණිවුඩය ලබන්නා පණිවුඩය සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය
- **ප්‍රතිපෝෂණය** - ලැබුණු පණිවුඩය ලැබුණු බවට හා තේරුම්ගත් බවට ලබන්නාගෙන් යවන්නා වෙත වාචික ව හෝ වාචික නොවන මාර්ගයකින් ලැබෙන ප්‍රතිචාරය



සුදුසු සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු

- සුදුසු බව
- වේගවත් බව
- පිරිවැය
- පැහැදිලි බව
- භාවිත කිරීමේ පහසුව

ClassWork.LK

ප්‍රවාහන සේවා

කිසියම් ස්ථානයක සිට තවත් ස්ථානයකට භාණ්ඩ හා මගීන් ගෙනයාම ප්‍රවාහනය ලෙස හැඳින්විය හැකි ය.

ප්‍රවාහනයේ මූලිකාංග

- **මාර්ගය** - ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා විවිධ මාවත

  උදා : මහා මාර්ග, දුම්රිය මාර්ග, ජල මාර්ග හා ගුවන් මාර්ග

- **මාධ්‍යය** - ප්‍රවාහන මාර්ගවල ප්‍රවාහන කටයුතු සඳහා යොදාගන්නා යානවාහන

  උදා : බස්, දුම්රිය, නැව්, ගුවන් යානා

- **බලය** - ප්‍රවාහන මාධ්‍යයන් ධාවනය කිරීමට භාවිත කරන ශක්තීන්

  උදා : සූර්ය බලය, ගෑස්, විදුලිය, ඉන්ධන

- **පර්යන්තය** - ප්‍රවාහන මාධ්‍යය හැසිරවීම සඳහා භාවිතයට ගන්නා ස්ථානය

  උදා : බස් නැවතුම, වරාය, දුම්රිය ස්ථානය, ගුවන් තොටුපළ

ClassWork.LK

සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක

- භාණ්ඩයේ ස්වභාවය
- ප්‍රවාහන පිරිවැය
- ධාරිතාව
- ආරක්ෂාව
- වේගය
- සුලභතාව

ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රවාහනය දයක වන ආකාරය

- නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය සම්පත් ලබා ගැනීමට.
- භාණ්ඩ වෙළෙඳපළ කරා බෙදා හැරීමට.
- සේවකයන් ප්‍රවාහනයට.
- භාණ්ඩ පාරිභෝගිකයා වෙත ප්‍රවාහනයට.

ClassWork.LK

ප්‍රවාහන මාර්ග

ව්‍යාපාරික කටයුතු ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා විවිධ මාවත් ප්‍රවාහන මාර්ග නම් වේ.

- මහා මාර්ග
- දුම්රිය මාර්ග
- ජල මාර්ග
- ගුවන් මාර්ග

මහා මාර්ග ප්‍රවාහනය

ගොඩබිමෙහි පිහිටි මාර්ග යොදා ගනිමින් කරන ප්‍රවාහනය යි.

වාසි	අවාසි
▪ ගමනාන්තය දක්වා ම යොදා ගත හැකි වීම. ▪ ඕනෑම වේලාවක යොදාගත හැකි වීම.	▪ මාර්ග තදබදය ඇති විටක දී ප්‍රමාද වීම. ▪ මාර්ග අනතුරු සාපේක්ෂ වශයෙන් වැඩි වීම. ▪ පරිසර දූෂණයට ඇති බලපෑම.

ClassWork.LK

දුම්රිය මාර්ග ප්‍රවාහනය

භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සඳහා දුම්රිය මාර්ග යොදා ගනිමින් කරනු ලබන ප්‍රවාහනය යි.

ශ්‍රී ලංකාවේ පවතින්නේ මුහුදුබඩ දුම්රිය මාර්ගය,උඩරට දුම්රිය මාර්ගය, උතුරු හා කැලණි වැලි දුම්රිය මාර්ගය වැනි සීමිත දුම්රිය මාර්ග කිහිපයකි.

වාසි	අවාසි
▪ විශාල වශයෙන් මගීන් හා භාණ්ඩ ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කළ හැකි වීම. ▪ දුර ගමන් සඳහා විශේෂ සේවාවන් තිබීම. ▪ දුම්රිය මාර්ග තදබදයක් ඇති නොවීම.	▪ බොහෝ විට ගමනාන්තය දක්වා ම යොදගත නොහැකි වීම. ▪ මගීන්ට අවශ්‍ය ඕනෑම වේලාවක දුම්රිය සේවාව ලබාගත නොහැකි වීම.

ClassWork.LK

ගුවන් මාර්ග ප්‍රවාහනය

භාණ්ඩ හා මගීන් ගුවනින් කරන ප්‍රවාහනය ගුවන් මාර්ග ප්‍රවාහනය යි.

රටක අභ්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා මෙන්ම ජාත්‍යන්තර ප්‍රවාහන කටයුතු සඳහා ද ගුවන් මාර්ග ප්‍රවාහනය යොදා ගනී.

වාසි	අවාසි
▪ වේගය වැඩිවීම. ▪ මගී සුව පහසුව වැඩිවීම. ▪ ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා පිටිවහලක් වීම.	▪ ප්‍රවාහන වියදම අධික වීම. ▪ අනතුරක දී සිදුවන විනාශය වැඩි වීම. ▪ බරින් අධික භාණ්ඩ ප්‍රවාහනය කළ නොහැකි වීම.

Class Work LK

ජල මාර්ග ප්‍රවාහනය

සාගර, ගංගා, ඇළ මාර්ග ආදී ජල මාර්ග යොදා ගනිමින් සිදු කරන ප්‍රවාහනයයි.

වාසි	අවාසි
▪ එකවර භාණ්ඩ හා මගීන් විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කළ හැකි වීම. ▪ ප්‍රවාහන ගාස්තු සාපේක්ෂ ව අඩු වීම. ▪ ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා පිටිවහලක් වීම. ▪ බරින් වැඩි භාණ්ඩ ප්‍රවාහනය කළ හැකි වීම.	▪ ප්‍රවාහනයට වැඩි කාලයක් ගතවීම. ▪ සෑම ගමනාන්තයක් සඳහාම යොදගත නොහැකි වීම.

ClassWork.LK

ClassWork.LK